සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**පළමු වාර පරීක්ෂණය 2015 - නොවැම්බර්**

**13 ශ්‍රේණිය** **දේශපාලන විද්‍යාව** **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(1) | 4 -(2) | 5 -(5) | 6 -(5) | 7 -(3) | 8 -(3) | 9 -(5) | 10 -(2) |
| 11 -(5) | 12 -(5) | 13 -(1) | 14 -(3) | 15 -(3) | 16 -(1) | 17 -(5) | 18 -(5) | 19 -(4) | 20 -(2) |
| 21 -(4) | 22 -(4) | 23 -(5) | 24 -(5) | 25 -(3) | 26 -(4) | 27 -(1) | 28 -(2) | 29 -(5) | 30 -(1) |
| 31 -(2) | 32 -(4) | 33 -(3) | 34 -(5) | 35 -(1) | 36 -(5) | 37 -(3) | 38 -(3) | 39 -(4) | 40 -(4) |
| 41 -(1) | 42 -(4) | 43 -(2) | 44 -(4) | 45 -(5) | 46 -(1) | 47 -(5) | 48 -(4) | 49 -(3) | 50 -(1) |

## II කොටස

### A කොටස

(01) මොන්ටෙස්ක්‍යු / නීතියේ සාරය

(02) සිංහල / දෙමළ

(03) මූලික අයිතිවාසිකම් / නියෝජන සිද්ධාන්ත

(04) • දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණයක් නොවීම • ආණ්ඩුකරුගේ අවධාරිත බලතල ක්‍රියාත්මක වීම

(05) • ජනතාවගේ දේශපාලන සහභාගීත්වය වර්ධනය වීම • රාජ්‍ය සුභසාධන වාදය වර්ධනය

(06) • ව්‍යවස්ථාදායකය තුළ ස්ථිර මුදල් කාරක සභාව පිහිටුවීම • උගත් ලාංකිකයෙකු වෙනුවෙන් නියෝජිතයෙකු තෝරා ගැනීම.

(07) ජාතික නිදහස දිනා ගැනීම / දේපල ක්‍රමයේ පරිවර්තනයක් තුළින් සමාජවාදයක් ගොඩනැගීම.

(08) • මූලික මිනිස් අයිතිවාසිකම් හඳුන්වාදීම • ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් ස්ථාපිත කිරීම

(09) 1776 / 1789

(10) • සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය • ආර්ථික සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

(11) නීතිමය යුතුකම් / සදාචාරාත්මක යුතුකම්

(12) 1956 වර්ෂය / රාජ්‍ය සඳහා විශේෂ විධිවිධාන පනත

(13) ජාතික නිදහස දිනා ගැනීම / දේපල ක්‍රමයේ පරිවර්තනයක් තුළින් සමාජවාදයක් ගොඩනැගීම.

(14) ප්‍රාදේශීය නියෝජිත ක්‍රමය / නාමකරණයෙන් පත්කිරීම

(15) • මුදල් නොවන පනත් කෙටුම්පත් ආරම්භ කිරීම. • මුදල් පනත් කෙටුම්පත් සම්මතවීම මාසයක් ප්‍රමාද වීම.

(16) ප්‍රජාතන්ත්‍රවාය තුළ පුරවැසියන් කිසිදු විශේෂීකරණයකට ලක් නොකිරීම හා සමාජ, ආර්ථික දේශපාලන අධිකරණ ක්ෂේත්‍රයන්හි සමාන අවස්ථා උදාකර දීම.

(17) ප්‍රතිජානනාත්මක නිදහස / ප්‍රතිශේධාත්මක නිදහස

(18) රටසභා / දිස්ත්‍රික් සංවර්ධන සභා

(19) • සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය. • ආර්ථික සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය.

(20) බස්නාහිර පළාතේ ආසනයක් දෙන බවට ජාතික සංගම් නායකයින් දුන් පොරොන්දුව ඉටු නොවීම.

## B කොටස

(01) (i) බලකිරීම මගින් අවනත බව ලබා ගත හැකි ශ්‍රේෂ්ඨ මානව සංවිධානය රාජ්‍යයයි. ආණ්ඩුව යනු රජයේ පොදු අරමුණු මුදුන් පමුණුවා ගැනීමට භාවිතා කරනු ලබන දේශපාලන යාන්ත්‍රණයයි.

රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනස්කම් පහත ආකාරයට විග්‍රහ කළ හැකිය.

1. ආයතනික ස්වභාවය
2. ස්වාධිපති බලය භුක්තිවිඳීම
3. සාමාජිකත්වය
4. ස්ථාවරත්වය
5. රාජ්‍යය හා පුරවැසි සබඳතා
6. ස්ථානගත වීම (මෙම කරුණු සන්සන්දනාත්මකව විස්තර කර ඇත්නම් උපරිම ලකුණු දෙන්න.)

(ii) රාජ්‍යයේ අරමුණු ක්‍රියාවට නංවන දේශපාලන යාන්ත්‍රණය මානව සමාජයට අත්‍යවශ්‍ය වන්නේ එයින් ඉටුවන අභ්‍යන්තර හා බාහිර කාර්යයන් නිසාය.

<u>ආණ්ඩුවේ බාහිර කාර්යයන් කිහිපයකි,</u>

- ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.
- රාජ්‍යයේ භෞතික පැවැත්ම හා දේශසීමා ඒකාග්‍රතාවය ආරක්ෂා කිරීම.
- ජාතික ආර්ථිකය වර්ධනය කිරීම.
- ජාතික අභිමානය ආරක්ෂා කිරීම.
- ජාතික දේශපාලන මතවාදය ආරක්ෂා කිරීම.

<u>ආණ්ඩුවේ අභ්‍යන්තර කාර්යයන් :</u>

- නීතිය හා සාමය ආරක්ෂා කිරීම
- සුභසාධක සේවාවන් පවත්වාගෙන යාම
- ආර්ථික කටයුතු කළමනාකරණය
- සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම
- සමාජ ගැටුම් කළමනාකරණය
- මානව සංවර්ධනය

(ii) ග්‍රීක දාර්ශනික ප්ලේටෝ ආකාර 07 ක ආණ්ඩුක්‍රමයක් පිළිබඳව සඳහන් කරයි. පරමාදර්ශී රාජ්‍ය පාලන ක්‍රමය, රාජාණ්ඩු ක්‍රමය, රදළ ආණ්ඩු ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය ප්ලේටෝ සඳහන් කරන ජනතා සුභසිද්ධිය අරමුණු කරගත් යහපත් ආණ්ඩුවේ ආඥාදායක රාජාණ්ඩු ක්‍රමය කතිපයාධි ආණ්ඩු ක්‍රමය, දූෂිත ප්‍රජාතන්ත්‍රවාදය ප්ලේටෝගේ වර්ගීකරණය අනුව අයහපත් ආණ්ඩුවේ ඒවා පාලකයින්ගේ යහපත උදෙසා ක්‍රියාත්මක වේ. මේ අතර ඒකීය හා සන්ධීය ව්‍යුහයන් ද, පාර්ලිමේන්තු හා පාර්ලිමේන්තු නොවන ආකෘතීන් ද ක්‍රියාත්මක විය හැකිය.

(02) (i) රාජ්‍ය බලය ව්‍යුහාත්මක වශයෙන් සංවිධානය වී ඇති ආකාරය පදනම් කොටගෙන ලෝකයේ පවත්නා රාජ්‍ය ක්‍රම ඒකීය හා සන්ධීය හෙවත් ෆෙඩරල් වශයෙන් වර්ග කෙරේ. ඒකීය ආණ්ඩු ක්‍රමයක සියලුම ආණ්ඩුක්‍රමික බලතල පවරා දී ඇත්තේ එක් මධ්‍යම ආණ්ඩුවකටය. එම මධ්‍යම ආණ්ඩුවේ බලාධිකාරයට ව්‍යවස්ථාමය සීමාවන්ද නැත. සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ලක්ෂණය වන්නේ රාජ්‍යයේ ස්වාධිපති බලය මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදා හැර තිබීමය. (මෙම ආණ්ඩුක්‍රම දෙකෙහි ලක්ෂණ ඇතුලත් කර තිබේ නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)

(ii) ලොව සන්ධීය ආණ්ඩුක්‍රම ප්‍රවේශ දෙකක් යටතේ නිර්මාණය වී තිබේ.

1. ස්වාධීන දේශපාලන ඒකක කිහිපයක් පොදු අරමුණක් වෙනුවෙන් එකතු වීම.
2. සන්ධීය නොවූ රාජ්‍යයක් තුළ නිශ්චිත දේශපාලන හේතු මත පවත්නා ප්‍රාන්තවලින් සැඳුම්ලත් සන්ධීය ක්‍රමයක් බිහි කිරීම.

<u>යහපත් ලක්ෂණ</u>

- විවිධත්වය තුළ ඒකීයත්වය ඇති කිරීම.
- පාලනයේ කාර්යක්ෂම බව ඇති කිරීම.
- ජාතිවාදී ගැටලුවලට ප්‍රායෝගික විසඳුමක් දීම.
- ප්‍රාදේශීය ලෙස විසිරී ඇති සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම.
- ජාතික ආරක්ෂාව හා සුරක්ෂි බව තහවුරු කිරීම.
- ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් වීම හා ජාත්‍යන්තර පිළිගැනීම වර්ධනය වීම.

<u>අයහපත් ලක්ෂණ</u>

- සාර්ථක විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම අපහසු වීම.
- කොටස් රාජ්‍යයන් වෙන්ව යාමේ තර්ජනය හේතු කොටගෙන දේශපාලන අස්ථාවරත්වය ඉහළ මට්ටමක පැවතීම.
- වෙන් වෙන්ව ජීවත් වන වාර්ගික කොටස අතර ගැටුම් ඇති වීමට ඉඩකඩ වැඩි වීම.
- ද්විත්ව ආණ්ඩුක්‍රමයක් පැවතීම හේතු කොටගෙන කාලය හා මුදල් අනවශ්‍ය ලෙස නාස්ති වීම.

(iii) සන්ධීය ක්‍රමයන්හි ආකෘතිමය වෙනස්කම් දක්නට ලැබේ. ඉන්දියාවේ ඇත්තේ ''මධ්‍යගත වාදී සන්ධීය ක්‍රමයකි. ඇමරිකාව, කැනඩාව, ජර්මනිය, ඕස්ට්‍රේලියාව වැනි සන්ධීය දාමයන්හි ප්‍රාන්ත ඉන්දියාවේ ප්‍රාන්ත වල වඩා වැඩි ස්වාධීනත්වයක් භුක්ති විඳී. පකිස්ථානයේ ඇත්තේ ද මධ්‍යම ආණ්ඩුවේ පාලනයට යටත් ප්‍රාන්ත ආණ්ඩු ඇති සන්ධීය දාමයකි. පුළුල් පරාසයක විහිදෙන සන්ධීය ස්වරූපය තුළ සහසන්ධීය (confederation) ක්‍රමය යනු ස්වාධීන දේශපාලන ඒකක කිහිපයක් සීමිත පොදු අරමුණක් සඳහා පිහිටුවා ගන්නා රාජ්‍ය සංගමයකි. සහසන්ධීය ක්‍රමයක් තුළ මධ්‍යම ආණ්ඩුවට ඇත්තේ අඩු බලයකි.

(03) (i) නියෝජනය යන සංකල්පය වෙනුවෙන් පෙනී සිටීම යන්න අර්ථවත් කරයි. තමත් අභිමුවෙහි නැති ඡන්ද දායකයින් වෙනුවෙන් මන්ත්‍රීවරයෙක් පෙනී සිටීම, මැතිවරණයකදී දේශපාලන පක්ෂයක් වෙනුවෙන් අපේක්ෂකයෙකු පෙනී සිටීම, ජාත්‍යන්තර සමුලුවකදී රටක් වෙනුවෙන් ඇමතිවරයෙකු පෙනී සිටීම ආදිය නියෝජනය යන්නට උදාහරණ වේ. නියෝජන සංකල්පය අදට වැදගත්වන්නේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් ජනතාව වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයන් විසින් රට පාලනය කිරීමේ ක්‍රමය වර්තමානයේ අත්දකින බැවිනි. 1688 උත්කෘෂ්ට විප්ලවය, 1776 ඇමරිකානු නිදහස් සටන ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනය නැගී ඒම සම්බන්ධයෙන් තීරණාත්මක අවස්ථාවක් විය. විස්තරාත්මක නියෝජනය, සංකේතාත්මක නියෝජනය, ආරෝපිත නියෝජනය හා අභිලාෂ නියෝජනය ආදී වශයෙන් නියෝජනයක ප්‍රභේද පවතී.

(ii) නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් තම නියෝජිතයින් තෝරාගැනීමේදී භාවිතයට ගන්නා නියෝජන ක්‍රම දෙකක් ලෙස,

- සරල බහුතර නියෝජන ක්‍රමය,
- සමානුපාතික නියෝජන ක්‍රමය දැක්විය හැකිය.

මැතිවරණයකදී යම් මැතිවරණ කොට්ඨාශයක් වෙනුවෙන් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීනව තරඟවදින අපේක්ෂකයින් අතරින් සාපේක්ෂ බහුතරය දිනූ අපේක්ෂකයාට ආසනය හිමි කර දෙන ක්‍රමය සරල බහුතර නියෝජන ක්‍රමයයි. තනි මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ එහි පදනම වේ. ප්‍රාදේශීය නියෝජන ක්‍රමය, සාපේක්ෂ වැඩි ඡන්ද ක්‍රමය, වෙස්ට් මිනිස්ටර් ආකෘතියේ නියෝජන ක්‍රමය, කේවල මන්ත්‍රී ආසන ක්‍රමය ආදී නම් වලින් ද මෙය හැඳින්වේ.

සමානුපාතික නියෝජනය අර්ථ දක්වෙන්නේ මැතිවරණයකදී යම් මැතිවරණ දිස්ත්‍රික්කයක් සඳහා තරග වදින දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබාගන්නා ඡන්දවල අනුපාතයට ආසන බෙදාහරින ක්‍රමයකි.

(iii) සමානුපාතික නියෝජන ක්‍රමයේ හා සරළ බහුතර නියෝජනය ක්‍රමයේ මූලික වෙනස්කම් පියවර කිහිපයක් යටතේ සළකා බැලිය හැක.

- ඡන්ද කොට්ඨාශ බෙදීමේ ස්වභාවය.
- තරගකිරීමේ ස්වභාවය
- ඡන්ද දායකයන් විසින් ඡන්දය ප්‍රකාශ කිරීම
- මන්ත්‍රී ආසන බෙදා හැරීම
- පුරප්පාඩු පිරවීම

(04) (i) මිනිසාට තම පෞද්ගලික ක්‍රියාකාරකම් වර්ධනය කරගැනීමට අවශ්‍ය සමාජීය කොන්දේසි සිවිල් අයිතිවාසිකම් වේ. තම රටේ දේශපාලන ක්‍රියාදාමය සමඟ සම්බන්ධ වීමට පුරවැසියාට ඇති අයිතිය දේශපාලන අයිතිවාසිකම් වේ. පුරවැසියෙකු භුක්ති විඳින සිවිල් අයිතිවාසිකම් කිහිපයකි.

- ජීවත්වීමට ඇති අයිතිය.
- නිදහසේ සිතීමට හා අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය.
- දේපල අයත් කරගැනීමේ අයිතිය.
- සමානාත්මතාව පිළිබඳ අයිතිය.
- පවුල් ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය.
- අධ්‍යාපනය ලැබීමේ අයිතිය.
- කැමති දේශපාලන පක්ෂයකට සම්බන්ධවීමේ අයිතිය.
- පෞද්ගලික නිදහස පිළිබඳ අයිතිය.
- තමා කැමැති ආගමක් ඇදහීමේ අයිතිය.
- සංවිධානය වීමේ අයිතිය.
- වැඩ කිරීමට ඇති අයිතිය.
- ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය.

(ii) මානවයෙකු වීමේ හේතුවෙන් ඔහුගේ පැවැත්ම සහ ගෞරවය උදෙසා භාවිතයට ගැනෙන සියළුම අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් වේ. ලොව සැම ප්‍රජාතන්ත්‍රවාදී රටකම ගෞරයට පාත්‍ර වී ඇති මානව අයිතිවාසිකම් ඒ ඒ රටවල අනුගමනය කරන සමාජ ආර්ථික හා දේශපාලන දර්ශනය අනුව මූලික නීතිය තුළ අන්තර් ගත කළ යුතු ඒවා මූලික අයිතිවාසිකම් වේ. මූලික අයිතීන් ප්‍රභවය ලබන්නේ ද, මානව හිමිකම් ඇසුරිනි.

(iii) ප්‍රජාතන්ත්‍රවාදී රජයක අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා විවිධ ආයතන හා ප්‍රඥප්තීන් ක්‍රියාත්මක වේ. මේවා නීතිමය, දේශපාලනමය හා අන්තර්ජාතිකමය වශයෙන් විග්‍රහයේ පහසුව සඳහා වර්ග කළ හැකිය.
- නීතිමය ක්‍රියාමාර්ග
- දේශපාලනමය ක්‍රියාමාර්ග
- අන්තර්ජාතික ක්‍රියාමාර්ග (මේවායේ ලක්‍ෂණ දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

## C කොටස

(05) (i) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාදායකය වූයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට මුළු සාමාජික සංඛ්‍යාව 61 කි. මහජන ඡන්දයෙන් 50 ක් ද, නාමකරණයෙන් 8 ක් ද, නිලබලයෙන් 03 ක් ද වශයෙනි. ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නිල කාලය වසර 05 කි. නියමිත කාලයට පෙර විසුරුවා නොඇරියහොත් වසර පහ අවසානයේ දී මැතිවරණය් පවත්වා අලුතින් නියෝජිතයින් තෝරාපත් කර ගත යුතු විය. රාජ්‍ය මන්ත්‍රණ සභාව රැස්වූයේ කථානායකවරයාගේ ප්‍රධානත්වයෙනි. රාජ්‍ය මන්ත්‍රණ සභාව විධායක කාරක සභා 07 කට බෙදා ක්‍රියාවට නංවන ලදී.

(ii) දිවයිනේ විධායක බලය ක්‍රියාත්මක කිරීමට විධායක කාරක සභා 07 ට අමතරව <u>මහ ලේකම්</u>, <u>මුදල් ලේකම්</u> හා <u>නීති ලේකම්</u> වශයෙන් ආණ්ඩුකාරයාගෙන් පත්වීම ලත් රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකි.
(ඉහත ඉරි ඇඳි තනතුරු වල බලතල වෙන වෙනම දක්වා ඇත්නම් උපරිම ලකුණු ලබා දෙන්න.)

(06)
- 29 (2) වගන්තිය ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම.
- දෙවන මණ්ඩලයක් හඳුන්වා දීම.
- බහු මන්ත්‍රී කොට්ඨාශ ඇති කිරීම.
- අග්‍රාණ්ඩුකාරයා විසින් සාමාජිකයින් හය දෙනෙකු නාමකරණයෙන් ව්‍යවස්ථාදායකයට පත් කිරීම.
- විධායක විධිවිධානයක් ලෙස ඇමති තනතුරු කිහිපයක් සුළු ජාතීන් සඳහා වෙන් කිරීම.
- රාජ්‍ය සේවා කොමිෂම හා අධිකරණ සේවා කොමිෂම හඳුන්වා දීම.

(ඉහත ලක්‍ෂණ උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

(07) (i) මෙරට වාමාංශික ව්‍යාපාරය බිහිවීම කෙරෙහි ප්‍රධානව බලපෑ සාධක කිහිපයකි.
- සමකාලීන ලෝක ආර්ථික අර්බුදය.
- කම්කරු පන්ති ව්‍යාපාරයේ නැගී ඒම.
- සමාජවාදී මතයන් පැතිර යාම.
- කම්කරු හා සාමාන්‍ය ජනතාව බලගැන්වීම.

(ii) වාමාංශික ව්‍යාපාරයට පිරිස් බලය ලැබුනේත්, දේශපාලන අනුග්‍රහය ලැබුණේත්, මූලික වශයෙන් නාගරික කම්කරු පන්තිය තුළිනි. මෙහි නායකත්වය රැඩිකල් මධ්‍යම පන්තික බුද්ධිමතුන්ගෙන් සමන්විත වූ අතර ව්‍යාපාරයට දේශපාලන දර්ශනයක් සපයා දුන්නේ ඔවුන් විසිනි. අධිරාජ්‍යවාදයට හා ඔවුන්ට ගැතිකම් කළ ජාතික සංගම් නායකත්වයට විරුද්ධව පොදු ජනතාව සංවිධානය කිරීමට එම නායකත්වයට සිදු විය.

(iii) රැඩිකල් වාදී සුළු ධනේෂ්වර කොටස්වලට අයත් වුවන්ගෙන් සැකසුනු මෙම සංවිධානය සතුව ජාතික ව්‍යාපාරයට සාපේක්ෂව පැහැදිලි අරමුණු කිහිපයකි.
1. ජාතික නිදහස පූර්ණව දිනා ගැනීම.
2. නිෂ්පාදනය, බෙදාහැරීම, හුවමාරු මාධ්‍යයන් සමාජය සන්තක කිරීමට අදාළව දේපළ ක්‍රමයේ පරිවර්තනයක් ඇති කිරීම.
3. පන්ති / කුල, ආගම් ස්ත්‍රී, පුරුෂ සියළු භේද වලින් පැන නගින සියළු අසමානතා ඉවත් කිරීම.

(08) (i) මෙරට ජාතික ව්‍යාපාරයේ න්‍යාය වාදය වූයේ 20 වන සියවසේ දක්නට ලැබුණු යුරෝපීය ලිබරල් වාදයයි. ලංකා ජාතික සංගමයේ දිගුකාලීන අරමුණ වූයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය තුළ අභ්‍යන්තර ස්වයං පාලන තත්වය හිමි රටක් බවට ලංකාව පත් කර ගැනීමයි.

(ii) ප්‍රතිසංස්කරණ අරභයා වඩා ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම / මහජනතාවගේ දේශපාලන අදහස් සංවිධානය කිරීම / සභාපති ලෙස කථානායකවරයෙකු ඡන්ද විමසීමෙන් තෝරා ගත යුතුයි / අයවැය ලේඛනය පිළිබඳ සම්පූර්ණ බලය ආදී ක්‍රියාමාර්ග අරමුණු දිනා ගැනීමට දියත් කළ ක්‍රියාමාර්ග වේ.